# වාම

පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ මධ්‍යම පුවත්පත

09 කාණ්ඩය 04 කලාපය

2023 ජුනි

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. ආධාරය රු.70.00


## ජන අරගල ව්‍යාපාරය

### දෙවන මහා සමුළුවට සැරසේ

සිය දෙවන මහ සමුළුව ජුලි 8 කොළඹ දී පැවැත්වීමට ජන අරගලය ව්‍යාපාරය සැලසුම් කර ඇත. එහි ප්‍රකාශයකු පවසන පරිදි ජන අරගල ව්‍යාපාරයේ මෙහෙයුම් මණ්ඩල පුළුල් කිරීම සහ එහි වැඩකටයුතු වේගවත් කිරීම මෙම දෙවන මහා සමුළුවේ අරමුණ වේ.

ජන අරගල ව්‍යාපාරය, පිහිටුවනු ලැබූ එහි ප්‍රථම සමුළුව 2022 මාර්තු 27 දින නුගේගොඩ ආනන්ද සමරකෝන් පරිශ්‍රයේදී පැවැත්විණි.

එහිදී වාමාංශික ක්‍රියාකාරිකයන්, වෘත්තීය සමිති නායකයන්, සිවිල් සමාජ ක්‍රියාකාරිකයන්, සමන්විත මෙහෙයුම් මණ්ඩලයක් පත් කර ගැනුණි. එතැන් සිට පසුගිය වසර පුරා ජනතා ඉල්ලීම් ප්‍රමුඛ කරගනිමින් සටන් වැදුණු අතර ජන අරගල සභා පිහිටුවමින් අරගලයට සක්‍රියව දායක විය.

## රනිල් සමග ආණ්ඩුව පළවා හරින

# අන්තර්කාලීන ද්වි බල පාලනයකට පෙසපෙන් ඇරැයුම්!

**රට විකුණන ඩීලර් ....**




ආර්ථික අර්බුදයට විසඳුම යැයි කියමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ලබා දෙන ණය වෙනුවෙන් ආණ්ඩුව, ජනතා අයිතීන් කප්පාදු කිරීම හා ජනතා දේපළ විකිණීම පිළිබඳ විරෝධය පළකරමින් 'ජන අරගල ව්‍යාපාරය' පසුගිය මැයි 31 වැනිදා කොළඹ කොටුවේ පැවැත්වූ උද්ඝෝෂණයේ අවස්ථාවක්

**අනුප්‍රාප්තික ජනාධිපති රනිල් වික්‍රමසිංහ සමග වත්මන් පොහොට්ටු පාලනය වහාම ජන අරගලයකින් පහ කර දමා අන්තර්කාලීන ද්වි බල පාලනයක් කෙටි කලක් සඳහා ගොඩනැඟීමට විපක්ෂ සියළු බලවේග වලට එක්වන ලෙස පෙරටුගාමී සමාජවාදී පක්ෂය විවෘත ආරාධනයක් කරමින් ඉල්ලා සිටියි. මෙම දේශපාලන යෝජනාව පසුගියදා එම පක්ෂයේ ජාත්‍යන්තර කම්කරු දින රැලියේදී පෙරටුගාමී සමාජවාදී පක්ෂය විසින් ඉදිරිපත් කර තිබේ.**

වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ පොහොට්ටු පාලනයට කිසිදු ජනවරමක් නොමැති බවත් මැතිවරණ කල් දමමින් මර්දනය තුලින් බලහත්කාරී ලෙස ජන අනුමැතියකින් තොරව රැඳී සිටින බව අවධාරනය කරන පෙරටුගාමී සමාජවාදී පක්ෂය ජනතා අරගලය කින් එය පලවා හැරීම හැර වෙන විකල්පයක් නොමැති බව ද කියා සිටී.

අධිරාජ්‍යවාදීන්ගේ සහ ලෝක බලවතුන් අතර පවතින කලාපීය බල අරගලයේ දී ☞ 02 පිටුවට

## ආසියාවේ සාගතය ඉදිරියෙන්

### එක්සත් ජාතීන්ගේ වාර්තාවක් කියයි

ලෝක ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණ තත්ත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නවතම වාර්තා අනුව සාගින්නෙන් පෙළෙන වැඩිම ජනතාවක් සිටින මහද්වීපය බවට ආසියානු මහද්වීපය පත් වී තිබේ. කාලයක් තිස්සේ අප්‍රිකානු මහද්වීපයට මෙම ස්ථානය හිමි වී තිබුණි.

නමුත් 2021 වසරේ වාර්තාවලට අනුව ආසියානු මහද්වීපයේ සාගින්නෙන් පෙළෙන ජනගහනය මිලියන 425 ක් ලෙස ගණන් බලා තිබේ. අප්‍රිකානු ☞ 02 පිටුවට

## ආසියාවේ බඩගින්න ඉහළ යද්දී චීනය උඩුගුවන අල්ලයි

අභ්‍යවකාශය ජය ගැනීම සඳහා වූ ලෝක බලවතුන් අතර ඇති තරඟයෙන් චීනය වේගයෙන් ඉදිරියට පැමිණෙමින් සිටී. මේ වන විටත් චීනය විසින් ඉදිකර ඇති මිනිසුන් සහිත අභ්‍යවකාශ මධ්‍යස්ථානය වෙත සිවිල් පුරවැසියකු සහිත Shenzhou 16 යානය සාර්ථකව ගුවන්ගත කෙරුණු අතර මීට පෙර හතර වතාවක් එලෙස ගමන්කර ඇත. මෙවර විශේෂත්වය වන්නේ මෙම අභ්‍යවකාශ ගමන සඳහා ප්‍රථම වරට සිවිල් පුරවැසි සම්බන්ධ කර ගැනීමයි. බෙන්හැයි සරසවියේ මහාචාර්ය ගුයි හයිබාවෝ චීන ☞ 02 පිටුවට

## ජනගහනයෙන් 40%ක අධ්‍යාපන සහ සෞඛ්‍ය වියදම් කපා හැරලා

ලංකාවේ ජනගහනයෙන් 40%කගේ අධ්‍යාපන හා සෞඛ්‍යයට වෙන්කරන මුදල් කපා හැර දමා ඇතැයි මහ බැංකු වාර්තා පවසයි. ආහාර උද්ධමනය ඉහළ යාම මේ සඳහා බලපා තිබේ. මහ බැංකුවේ නවතම වාර්තා පෙන්වා දෙන පරිදි අවුරුදු පහට අඩු දරුවන්ගෙන් 43% ක් මන්දපෝෂණයෙන් පෙළෙන අතර පාසල් යන වයසේ දරුවන් ගෙන් 14%ක් මන්දපෝෂණයෙන් පෙළේ. ළමා මන්දපෝෂණය බහුලව ඇති දිස්ත්‍රික්ක ලෙස අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව සහ නුවරඑළිය හඳුනාගෙන තිබේ.

☞ 02 පිටුවට

## ආචාර්යවරු රට හැර යති විශ්වවිද්‍යාල පණ අදී!

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම යටතේ පාලනය වන විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන දාහතක් ඇති අතර මේ වන විට ඒවායේ සමස්ත ආචාර්ය හා මහාචාර්ය හිඟය 4,616ක් ඉක්මවා ගොස් තිබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ප්‍රකාශකයෙකු උපුටා දක්වමින් මෙම කරුණු පසුගියදා සති අන්ත පුවත් පතක් මගින් හෙළිදරව් කර තිබුණි. ආචාර්යවරු මහාචාර්යවරු ඇතුළු සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 11,297 ක් අවශ්‍ය වුවත් මේ වන විට සමස්ත විශ්වවිද්‍යාල ☞ 02 පිටුවට